# SLLA පුවත් හසුන

වෙළුම 37 කලාපය 01 ජුලි - සැප්තැම්බර් 2020 ISSN 1391 -2531






## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිතුමන්ගේ පණිවුඩය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නව පාලක මණ්ඩලයක ධූරකාලය ඇරඹෙන මේ මොහොතේ ඔබ සැමට සුබ පැතුම් පිරිනැමීමට ලැබීම මට මහත් සතුටකි. පසුගිය මාස කිහිපය තුළ කොවිඩ් -19 වසංගතය මගින් ජීවන ර ටාවේ බොහෝ වෙනස්කම් සිදු කරන ලදී. පුස්තකාල වෙත භෞතික ප්‍රවේශය වැළැක්වීමේ දුර්ලභ සිදුවීම අප අත්දුටු අතර, අර්බුදකාරී අවස්ථාවකදී සේවාවන් පවත්වාගෙන යාම පිළිබඳ නව පාඩම් අපි උගතිමු. මාර්ගගත හෙවත් 'ඔන්ලයින්' සේවා, ඒ කෙරෙහි උනන්දුවක් නොදක්වූවන් අතර පවා සම්මතයක් බවට පත්විය.

මෙම ගෝලීය හා දේශීය කැලඹීම් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය රටේ පුස්තකාල වෘත්තිය හොඳම ගමනාන්තය කරා රැගෙන යාමට සූදානම්ව සිටී.මෙම ගෞරවනීය වෘත්තිය තුළ වෘත්තීයභාවය සහ ආචාර ධර්ම පවත්වාගෙන යාමට දැඩි උත්සාහයක් දරන අතරම, අපගේ වෘත්තිකයින්ට ඔවුන්ගේ වෘත්තීන්හි ස්ථාවරත්වය සහතික කිරීමට අපි කැප ව සිටිමු.

විවිධ පුස්තකාල වර්ග සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටීන්හි ඇති විෂමතා නිවැරදිකිරීමේ අවශ්‍යතාව තිබේ. මේ සම්බන්ධයෙන් රජයේ, පළාත් සහ පාසල් පුස්තකාල යන අංශ පිළිබඳ විශේෂ අවධානයක් අවශ්‍ය වේ. රැකියා ප්‍රමිති නියාමනය කිරීම සහ වඩා හොඳ සේවා කොන්දේසි පවත්වාගැනීම සඳහා පුස්තකාල සංගමය අදාළ සංවිධාන හා රජයේ බලධාරීන් සමඟ සාකච්ඡා කරමින් සිටී.

ගුණාත්මකභාවය සහ අදාළත්වය ඉහළ නැංවීම සහ දේශීය හා ජාත්‍යන්තර සුදුසුකම් රාමු සමඟ පෙළගැස්වීමෙන් පුස්තකාලවේදීත්ව අධ්‍යාපනය විධිමත් කිරීම ද නව වාරයේ අපගේ ප්‍රමුඛතා අතර වේ. පුස්තකාල විද්‍යා අධ්‍යාපනය සහ රැකියාව එකිනෙක සමඟ සමීපව සම්බන්ධ විය යුතුය. ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙම ක්ෂේත්‍රය තුළ තම වෘත්තීය දියුණුව සඳහා වඩාත් පැහැදිලි මාවතක් දැකිය යුතුය.

අනාගත පුස්තකාලයාධිපතිවරුන් අතර කුසලතා හා නිපුණතා වර්ධනය කිරීම සඳහා පමණක් පුස්තකාල විද්‍යා අධ්‍යාපනය කිසි විටෙකත් සීමා නොවිය යුතුය. පුස්තකාල න්‍යායවාදීන්, පර්යේෂකයින්, නවෝත්පාදකයින් සහ ව්‍යවසායකයින් ද මෙමගින් බිහිවිය යුතුය. එබැවින්, වර්තමාන ගැටලු පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයන්, සායනික තක්සේරු සහ තීරණගැනීම් සිදුකිරීම, පුස්තකාල සංගමය ඉදිරියට ගෙනයාම සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම ප්‍රයත්නයේදී අපගේ සියලුම සාමාජිකයින් අප වටා සිටිනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. තවමත් සාමාජිකයන් නොවන හෝ මෑතකදී සාමාජිකත්වය අලුත් නොකළ සහෘදයන් ඉක්මනින් අප සමග අත්වැල් බැඳ ගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු. ඔබේ වෘත්තීය ජීවිතය සඵලවනු දැක්ම අපේ ප්‍රාර්ථනාව යි!

ආචාර්ය රුවන් ගමගේ
සභාපති - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

## ඇතුල් පිටු

| | |
|---|---|
| සභාපතිතුමන්ගේ පණිවුඩය | 01 |
| ඩිප්ලෝමා සම්මාන ප්‍රදානෝත්සවය | 02 |
| ඩිප්ලෝමා ශිෂ්‍යත්ව සහ සම්මාන | 02 |
| SLLA 60 වන වාර්ෂික මහා සභා රැස්වීම | 02 |
| අධි සාමාජිකත්වය (Fellowship) ප්‍රදානය 2020 | 03 |
| ආශ්‍රෙය සාමාජිකත්වය (Associateship) ප්‍රදානය 2020 | 03 |
| විජිත ද සිල්වා පර්යේෂණ සම්මාන (Vijitha De Silva Research Award) | 03 |
| TVEC නියෝජිතයින්ගේ සපැමිණීම | 04 |
| ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳ පුවත් (DIPLIS NEWS) | 04 |
| SLLA පාලක මණ්ඩල සාමාජිකයින් (Council Members) 2020/2021 | 04 |
| නිවේදන | 04 |

The SLLA Newsletter is published quarterly by the Sri Lanka Library Association.
An e-copy of this Newsletter is available at http://www.slla.org.lk
*Sri Lanka Library Association, Organization of Professional Associations, Sri Lanka, 275/75, Stanly Wijesundara Mawatha, Colombo 07, Sri Lanka, Tel/Fax: +94-11-2589103, Email:slla@sltnet.lk*

## උසස් ඩිප්ලෝමා (HDIPLIS) සම්මාන ප්‍රදානෝත්සවය 2020



ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා (HDIPLIS) පාඨමාලාවේ සම්මාන ප්‍රදානෝත්සවය 2020 අගෝස්තු මස 25 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්විණි.





මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා සහභාගි විය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හිටපු සභාපතිවරු, පාලක මණ්ඩල සාමාජිකයින්, දේශකයින් සහ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරු සහභාගී වූ අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කළ සිසුන් 103 දෙනෙකු සඳහා සහතිකපත් බෙදා දෙන ලදී.

## උසස් ඩිප්ලෝමා (HDIPLIS) ශිෂ්‍යත්ව සහ සම්මාන ප්‍රදානය

**පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සඳහා වන**
**එස්.සී. බ්ලොක් අනුස්මරණ ශිෂ්‍යත්ව**

පළමු මට්ටම – 2019/2020
ආර්.එම්.ඩී. රණතුංග මිය (සිංහල මාධ්‍යය)
දෙවන මට්ටම – 2018/2019
ඩබ්.එම්.එන්.ඩී. බණ්ඩාර මිය (සිංහල මාධ්‍යය)

**හොඳම ජයග්‍රාහකයා සඳහා වන රන් පදක්කම**
තෙවන මට්ටම - 2018/2019
ඩබ්ලිව්. ඒ. දර්ශිකා තිලිනි විජේසිංහ මිය

**සමස්ථ දක්ෂතාවය සඳහා වන ශ්‍රීකාන්තලක්ෂ්මී අරුලනන්තම් අනුස්මරණ සම්මානය - 2018/2017**
ඩබ්ලිව්. ඒ. දර්ශිකා තිලිනි විජේසිංහ මිය







## SLLA 60 වන වාර්ෂික මහා සභා රැස්වීම 2020

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වන වාර්ෂික මහා සභා රැස්වීම 2020 සැප්තැම්බර් 18 වන දින කොළඹ 07 හි, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්විණි. මෙහි සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගයනි ද අල්විස් මහත්මිය (Global Chairperson - Women in Logistics & Transport- WiLAT) සහභාගි වූ අතර ආචාර්ය නයනා විජයසුන්දර මහත්මිය(සභාපති - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය), ආචාර්ය රුවන් ගමගේ මහතා (තේරී පත් වූ සභාපති - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය), ලීලාමනි අමරසේකර මහත්මිය (ප්‍රධාන ලේකම්) ඇතුලු ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෘත්තිකයින් සහ සාමාජිකයින් මෙම අවස්ථාවට සහභාගි විය. 60 වන වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රධාන දේශනය ගයනි ද අල්විස් මහත්මිය විසින් පවත්වන ලදී.







සමාරම්භක උත්සවයෙන් පසු 2020/2021 වර්ෂය සඳහා නව පාලක මණ්ඩල සාමාජිකයින් සහ වෘත්තීය කණ්ඩායම්හි කැඳවුම්කරුවන් තෝරාපත් කර ගන්නා ලදී. ඒ අනුව 2020/2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නව සභාපති ලෙස පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනයේ (NILIS) අධ්‍යක්ෂ (වැ.බ.) ආචාර්ය රුවන් ගමගේ මහතා අභිනවයෙන් පත්විය.







## අධි සාමාජිකත්වය (FELLOWSHIP AWARDS) ප්‍රදානය









පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට ඉටුකරන ලද සුවිශේෂී දායකත්වය වෙනුවෙන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වන වාර්ෂික මහා සම්මේලනයේ දී, ඩී.එස්. ගුණසේකර, ආර්.ඒන් හර්ෂනී, ජී. අත්තනායක, ජී.එස්. ප්‍රේමරත්න, විශාඛාරූබන්, ඩබ්. ප්‍රේමදර්ශන සහ ඒන්.ඩී. පීරිස්, යන පුස්තකාල වෘත්තිකයින් සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධි සාමාජිකත්වය (Fellowship) ප්‍රදානය කරන ලදී.

## ආශ්‍රෙය සාමාජිකත්වය (ASSOCIATESHIP) ප්‍රදානය 2020

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වන වාර්ෂික මහා සම්මේලනයේ දී ආශ්‍රෙය සාමාජිකත්වය (Associateship) ලබාගත් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින්;

1. කේ. දනුෂා ස්වර්ණ අතුකෝරල
2. එච්. ජී. පී. එස්. චතුරිකා දිල්හානි
3. ආචාර්ය බී.එම්.එම්.සී.බී. හිඳගොල්ල
4. කේ.ඒ. විශාකා නර්මදා
5. පී. සී. චද්‍රකාන්ති පෙරේරා
6. ඩබ්. පී. ගයානි ලසන්ත පෙරේරා
7. පී.එම්. අයෝමි
8. පී . ප්‍රශාන්තන්
9. සෙල්වනායගම් සන්තරූබන්
10. එච්.එම්. තිලකරත්න
11. පී.ඊ. චතුරානි විජයමුනිගේ
12. ජී. සුලේඛා පත්මිණි විමලසිරි













## විජිත ද සිල්වා පර්යේෂණ සම්මාන (Vijitha De Silva Research Award) 2020



ආචාර්ය ආනන්ද තිස්ස (කැඳවුම්කරු), ලැගුම්දෙනියේ පියරතන හිමි, ආචාර්ය රුවන් ගමගේ, යූ.පී. අලහකෝන්, මහාචාර්ය ඩබ්. වීරසූරිය සහ සුගත් ගුණතිලක යන විද්වතුන් විසින් සම්පාදිත "An index to Library and Information Science Articles published in Sri Lanka from 1962 to 2018" සහ චන්දිමා දිසානායක(කැඳවුම්කරු) කුසුමාංජලී, චාන්දනී සෙනරත්, කාංචනා ද සිල්වා, චමරි යාපා, යමුනා ශීගනගමගේ සහ අමරා පතිරණ යන විද්වතුන් විසින් සම්පාදිත "Architectural designs for buildings, interior layout and furniture for small and medium size libraries in Sri Lanka" යන පුස්තකාල විද්‍යා පර්යේෂණ දෙක සඳහා 2020 වර්ෂයේ විජිත ද සිල්වා පර්යේෂණ සම්මානය සම ප්‍රදානයක් ලෙස පිරිනමන ලදී.



## TVEC නියෝජිතයින්ගේ සපැමිණීම

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, අධ්‍යාපන කමිටුව විසින් පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සඳහා NVQ මට්ටම ලබාගැනීම පිළිබඳව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) නිලධාරීන් සමඟ 2020 සැප්තැම්බර් මස 22 වන දින මූලික සාකච්ඡාවක් පවත්වන ලදී. පාඨමාලා සඳහා NVQ මට්ටම ලබා ගැනීමට පෙර සකස් කළ යුතු මාර්ගෝපදේශ ඔවුන් විසින් සපයන ලද අතර එම ප්‍රමිතීන්ට අනුකූලව මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සඳහා අධ්‍යාපන කමිටුව විසින් අනු කමිටුවක් පත් කරන ලදී.



## SLLA පාලක මණ්ඩල සාමාජිකයින් (COUNCIL MEMBERS)2020/2021

**සභාපති** : ආචාර්ය රුවන් ගමගේ මහතා
**හිටපු සභාපති** : ආචාර්ය එන්. ඩී. විජයසුන්දර මිය
**තේරී පත් වූ සභාපති** : ආචාර්ය ආර්.ඩී. ආනන්ද තිස්ස මහතා
**උප සභාපති** : ඇන්ටන් නල්ලතම්බි මහතා
**ප්‍රධාන ලේකම්** : ආචාර්ය කේ.ආර්.ඒ.එන්. හර්ශනි මිය
**සහකාර ලේකම්** : ප්‍රියදර්ශනී හේමකුමාර මිය
**භාණ්ඩාගාරික** : වරුණී ගඟබඩආරච්චි මිය
**අධ්‍යාපන නිලධාරී** : ආචාර්ය චම්පා අලහකෝන් මිය
**සහකාර අධ්‍යාපන නිලධාරී** : ප්‍රියානි බාලසූරිය මිය
**ප්‍රකාශන නිලධාරී** : ටී. ශ්‍රීධරන් මිය
**තොරතුරු හා මහජන සම්බන්ධතා නිලධාරී** : ආචාර්ය එස්.කේ. ඉලංගරත්න මහතා

**වෘත්තීය කණ්ඩායම් (Professional Group)**

**අධ්‍යයන පුස්තකාල** : නෝමන් රවිකුමාර් මහතා
COMAISP : එස්. සාන්තරූබන් මහතා
**රජයේ පුස්තකාල** : යානිකා නන්දසේන මිය
**ජාතික පුස්තකාලය** : විජය ප්‍රේමදර්ශන මහතා
**පළාත් පුස්තකාල** : වසන්තා කුරුප්පු මිය
**මහජන පුස්තකාල** : ධම්මික වීරකෝන් මහතා
**විශේෂ පුස්තකාල** : රංජනී හේරත් මිය
**පාසල් පුස්තකාල** : චන්දිමා දිසානායක මිය
**නම් කරන ලද පාලක මණ්ඩල සාමාජිකයින්** : 1. ශිවන්ති වීරසිංහ මිය
2. ලාල් පන්නිල මහතා
**නම් කරන ලද හිටපු සම-සාමාජිකයින්** : 1. සුනේත්‍රා පෙරේරා මිය
2. රුක්මලී සේපාලිකා මෙය

## ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳ පුවත් (DIPLIS NEWS)

**පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා (දෙමළ මාධ්‍ය) පාඨමාලාවේ සමාරම්භක උත්සවය**

පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා (1 වන මට්ටමේ) පාඨමාලාවේ සමාරම්භක උත්සවය 2020 ජූලි 26 වන දින මඩකලපුව මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. එම්.එන්. රවිකුමාර්, බී. ප්‍රශාන්තන්, ඒ.සී.ඒ. සතාත් සහ මඩකලපුව මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති ටී.සරවනපවන් යන විද්වතුන් මෙම අවස්ථාවට සහභාගී වූ අතර ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 40 ක් ලියාපදිංචි වී ඇත.



## SLLA ප්‍රකාශන කමිටුව (Publication Committee) 2020/2021

**ටී. ශ්‍රීධරන් මිය (ප්‍රකාශන නිලධාරි )**
**කෝමදී මුරුගදාස් මිය**
**එම්.එස්.එම්. ෂිහාම් මහතා**
**පවිත්‍රා විජයවර්ධන මිය**
**චන්දිමා වාදසිංහ මිය**
**බී.එන්.ජී.ඒ සුනිල් ප්‍රේමරත්න මහතා**
**ඒ.වී.එම්.කේ. අංකුඹුර මිය**

## පුවත් හසුන ( SLLA Newsletter : Vol. 37 No. 02 -Oct. – Dec. 2020)

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන, ත්‍රෛමාසික පුවත් හසුනෙහි පළ කිරීම සඳහා, ඔබගේ පුස්තකාල තොරතුරුවල පුවත්, මෘදු පිටපතක් ලෙස (MS Word ආකෘතියෙන්) ප්‍රකාශන නිලධාරි sritharan@lib.cmb.ac.lk හෝ sllapublicationofficer@gmail.com වෙත, විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න .

## නිවේදන

**ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන සඟරාව ( Sri Lanka Library Review (SLLR)**

වසරකට කලාප දෙකක් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන සඟරාවේ (Sri Lanka Library Review) 2021 වර්ෂයේ පළමු කලාපය (වෙළුම 35, කලාපය 1) සඳහා 2020 නොවැම්බර් මස 31 දින වන තෙක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින්ගෙන් සහ විද්වතුන්ගෙන් ලිපි (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) කැඳවනු ලැබේ. ඔබගේ ලිපියේ මෘදු පිටපතක් (MS Word ආකෘතියෙන්) ප්‍රකාශන නිලධාරි sritharan@lib.cmb.ac.lk හෝ sllapublicationofficer@gmail.com වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය හැකි අතර මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ www.slla.org.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.


ආපසු ලිපිනය :

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය,
OPA මධ්‍යස්ථානය,
275/75, ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07.


වෙත :